**පොලිස් ත්‍යාග අරමුදල - 2020**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

පොලිස් ත්‍යාග අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1865 අංක 16 දරන පොලිස් ආඥා පනතේ 73(4) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රථවාහන දඩමුදල් ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම නිසා රථ වාහන දඩමුදල් ආදායම හා ලැබිය යුතු රථවාහන දඩ මුදල් ආදායම රු.150,127,525 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් 2020 වර්ෂය සඳහා ලැබිය යුතු ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා අදාල රු.150,127,525 ක මුදල් 2021 වර්ෂයේ ලැබී ඇත. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) අධිකරණ 09 කින් විගණනයට ලබා දී තිබූ ආදායම් තහවුරු කිරීමේ වට්ටෝරු සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනයේ වාර්ෂික උසාවි දඩ මුදල් ආදායම සැසඳීමේදී අධිකරණ 05 ක එකතුව රු. 26,781,472 ක් අඩුවෙන්ද අධිකරණ 04 ක එකතුව රු. 10,336,765 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අධිකරණ ආදායම තහවුරු කිරීමේ වට්ටෝරු හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අංක 3 හි උසාවි දඩ මුදල් ආදායම සැසඳීමේදී අධිකරණ දෙකක එකතුව රු.183,694 ක මුදලක් අඩුවෙන් දක්වා තිබුණි. අධිකරණ තුනෙන් වාර්තා කර ඇති දඩ මුදල වැඩියෙන් දක්වා නොතිබුණි. | නොසැසඳීම් පරීක්ෂාකර හේතු හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පදනම් කරගනු ලැබූ ස්ථාවර තැන්පතු පොලී ප්‍රතිශතය හා අලුත් කිරීමේ නිවේදනවල (Renewal Notice) සඳහන් පොලී අනුපාතිකයන්ගේ වෙනස් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් 04 ක් වෙනුවෙන් ගිණුම්ගත කර තිබූ ස්ථාවර තැන්පතු පොලී රු. 2,467,022 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පොලී ආදායම් රු. 2,467,022 ක මුදලක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණු අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි ආයෝජන ආදායම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) විගණනයේ කරන ලද ගණනය කිරීම් අනුව ස්ථාවර තැන්පතු 04 කට අදාලව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම තැන්පතු 03 කට අදාලව රු.367,859 ක් වැඩියෙන් හා තැන්පතුවකට අදාලව රු.32,824 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු ආයෝජන ආදායමේ රු.335,035 ක් වැඩියෙන් ගිණුම් ගත කර ඇත. 2021 වර්ෂයේ ගැලපීම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි ආයෝජන ආදායම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) 2016 වර්ෂයට අදාලව විශේෂ ත්‍යාග ගොණුවක ඉතිරි සියයට පනහ සඳහා වූ රු.130,000 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණද, එම වටිනාකම ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකමින් අඩු නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ගෙවා ඇති විශේෂ ත්‍යාග මුදල වන රු. 135,000 ක මුදල ගෙවිය යුතු විශේෂ ත්‍යාග ශේෂයට ඇතුලත් කර තිබුණි. ගෙවිය යුතු විශේෂ ත්‍යාග ශේෂය රු. 90,876,211 ක් ලෙස නිවැරදි විය යුතුය. | විශේෂ ත්‍යාග ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) ගෙවිය යුතු විශේෂ ත්‍යාග ලෙස ගිණුම්ගතව නොතිබූ 2008 හා 2006 වර්ෂ සඳහා වූ විශේෂ ත්‍යාග ගොණු දෙකකට අදාලව ඉතිරි සියයට පනහ ලෙස රු.235,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ අතර එය ඉකුත් වර්ෂ ගැලපීමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් නොකර වර්ෂයේ වියදමක් ලෙස ගලපා තිබුණි. | 2020.09.15 දින ගෙවන ලද රු. 175,000 ක සහ රු. 60,000 ක මුදල් විශේෂ ත්‍යාග අඩක් ගෙවීමේ ලේඛණයේ සටහන් කර ගෙවීම් කර ඇත. එය ගෙවිය යුතු බවට 2019 මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වී නොතිබුණි. 2020.12.31 දිනට ගෙවිය යුතු විශේෂ ත්‍යාග ශේෂය නිවැරදි වේ. | -එම- |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| අධිකරණ 41 ක විගණනයට ලබා දී තිබූ ආදායම් තහවුරු කිරීමේ වටිනාකම් සහ මූලා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනයේ වර්ෂය අවසානයේ ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම සැසඳීම | රු.103,400,336 | රු.30,467,288 | රු.72,933,048 | අධිකරණ 11 ක ලැබිය යුතු ආදායම රු.29,312,325 ක් වැඩියෙන්ද, අධිකරණ 02 ක රු.5,760,955 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | නොසැසඳීම් පරීක්ෂාකර හේතු හඳුනාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොලිස් අනුග්‍රාහක අරමුදලට අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.2,000,000 ක් අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 19 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | පොලිස්පතිතුමාගේ අනුමැතිය මත 2021.04.23 දින ජනල් සටහන මගින් සමුච්චිත අරමුදලට ගලපා කපා හැරීමට කටයුතු කර ඇත. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2001 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ පොලිස් නිලධාරීන්ගේ විශිෂ්ට ක්‍රියා සම්බන්ධව සියයට 50 ක් ගෙවා නිම කරන ලද විශේෂ ත්‍යාග ලිපිගොනු 400 කට අදාලව ඉතිරි ත්‍යාග මුදල් ගෙවීමට එක් එක් සිද්ධියට අදාල අධිකරණ කටයුතු අවසන් විය යුතුව තිබූ අතර, ගෙවීමට ඇති මුළු විශේෂ ත්‍යාග වටිනාකම රු.91,011,211 ක් විය. මෙම | විගණනයේ දක්වා ඇති පරිදි ගෙවිය යුතු විශේෂ ත්‍යාග පිළිබඳ තොරතුරු නැවත පරික්ෂා කිරීමට අදාල ක්‍රියා මාර්ග ගන්නා බව දන්වමි. | අධිකරණ කටයුතු අවසන්ව ඇති ගෙවිය යුතු විශේෂ ත්‍යාග ගොණු සම්බන්ධයෙන් පසුවිපරමක් සිදුකළ යුතුය. |

ගෙවිය යුතු විශේෂ ත්‍යාග පිළිබඳ තොරතුරු අදාල අංශ වෙත යොමුකර සමාලෝචිත වර්ෂයේදී අධිකරණ කටයුතු අවසන් වී ඇත්ද යන්න පිළිබඳ තහවුරු කිරිමක් ලබාගෙන අදාල ගෙවීම් කිරිමට කටයුතු කර නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ..

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | 2020 දෙසැම්බර් මස තැන්පත් කළ නමුත් 2021 ජුනි 30 දින වන විටත් උපලබ්ධි නොවූ වටිනාකම රු.530,905 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් ලැයිස්තුවේ ඇතුළත් රු351,200 ක මුදල 2021 නොවැම්බර් 12 වන දින මුදල් පොතෙහි ගිණුම් ගත කර ඇත. | අදාල ගැලපිම් කඩිනමින් සිදුකල යුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877. | | | |
| • 3 ඡේදය | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යන් පිළිබඳ කාර්තුමය වාර්තා සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතද පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. | එකහවේ. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2020 අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ට අනුව කටයුතු කළ යුතුය. |
| • 5.3 (ආ) ඡේදය | රාජ්‍ය බැංකු හා විවිධ මූල්‍ය ආයතනවල කර ඇති ආයෝජන වටිනාකම සනාථ කිරීමට හැකිවන ලෙස ශේෂ සනාථ කිරීමේ සහතිකවල සහතික කළ පිටපත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් නොකිරීම. | එකහවේ. විගණනය වෙත ආයෝජන කිරීම් ශේෂ සනාථ කිරීමේ ලිපි 2021.01.04 දින ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | චක්‍රලේඛය ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| • 6 (ඉ) ඡේදය | මූල්‍ය ප්‍රකාශන සඳහා සංඛ්‍යාත්මක දත්ත අගය ආසන්න රුපියලට ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සිදුකළ යුතු වුවත් එසේ සිදුකිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබීම. | ආසන්න ශත දෙකට වටයා අග්‍රිම ඉදිරිපත් කර ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | -එම- |

## 1.8 මුදල් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොලිස් ත්‍යාග අරමුදලට අයත් ලංකා බැංකුවේ ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ සෑම මසකම අවසන් දිනට මුදල් පොතට අනුව ශේෂය අවමය රු. මිලියන 299 සිට උපරිමය රු. මිලියන 695 දක්වා වූ පරාසයක පැවතුණි. එම මුදල් ආයෝජනය කර පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි. | රටතුල කොරෝනා වෛරසයේ බලපෑම හේතුවෙන් පොලිස් ත්‍යාග අරමුදලෙහි 2020 වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු අඩාල වූ අතර අරමුදලේ කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කිරීමේ ගැටලු ඇති විය. ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දෙමි. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවය කින් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) පොලිස් කොට්ඨාශ 6 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාග සඳහා වියදම් දැරීමට ලබාදුන් රු. 96,732,000 ක අග්‍රිම මුදලින් වියදම් නොකර නැවත ආපසු එවා තිබූ මුදල රු. 40,128,932 වූ අතර එම මුදල කොට්ඨාශ 06 වෙත ලබාදුන් මුදලෙන් සියයට 22 සිට සියයට 50 දක්වා වූ පරාසයක පැවතුණි. තවද නුවරඑළිය හා කොළඹ පොලිස් කොට්ඨාශ සඳහා වියදම් දැරීමට හතරවන කාර්තුවේදී ත්‍යාග අරමුදලෙන් ලබාදුන් මුළු අග්‍රිමය වූ රු.13,674,300 ක් උපයෝජනය කිරීමෙන් තොරව ආපසු එවා තිබුණි. ඒ අනුව කොට්ඨාශ වෙත අග්‍රිමය ලබා දීම හා ලබා ගැනීම ත්‍යාග ගෙවීමේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමෙන් තොරව සිදුවී තිබුණි. | කොට්ඨාශ සඳහා හිමි සාමාන්‍ය අග්‍රිමයන් නිකුත් කර ඇතත් එම අග්‍රිමයන් නිකුත් කිරිම මත ගෙවීම් කිරිමට ඇති හැකියාව පිළිබඳව විමසීමක් සිදු නොකර ඇති බැවින් අග්‍රිමය නැවත පියවා ඇත. | අවශ්‍යතාවය මත පමණක් මුදල් නිදහස් කිරීම හා ලද මුදල් උපයෝජනය පිළිබඳ අවධානය යොමුකල යුතුය. |

## 1.9 ආයෝජන කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළිවෙලින් රු. මිලියන 433, 386, 326, 469, 820, 1015 1,275 ක් හා 1198 බැගින් එකතුව රු.මිලියන 5,922 ක් | අරමුදලේ අතිරික්ත ආදායම් එලදායි පොලී ආදායම් යටතේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලැබේ. එය අරමුදලෙහි සුභසාධන | ආයෝජන ආදායම අරමුදලේ අරමුණු ඉටුකිරීම සඳහා උපයෝජනය විය |

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් ලෙස උපයාගෙන තිබුණද මෙම ආදායම් අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | වියදම් දැරීම සඳහා සහ අරමුදලෙහි අඛණ්ඩ පැවැත්ම සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා උපකාර වී ඇත. | යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,340,208,192 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,590,107,212 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,249,899,020 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රථ වාහන දඩමුදල් ආදායම රු.573,110,128 කින් අඩුවීම හා විශේෂ ත්‍යාග සඳහා ගෙවීම් රු.541,670,500 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොරෝනා වෛරසය මැඩ පැවැත්වීම හා මර්දනය කිරිම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින් සඳහා විශේෂ ත්‍යාග ලෙස රු. 5,000 බැගින් නිලධාරීන් 83,760 කට රු.418,800,000 ක් හා රු.3,000 බැගින් නිලධාරින් 51,548 කට රු154,644,000 ක් වශයෙන් අවස්ථා දෙකකදී ගෙවා තිබීම, ඉකුත් වර්ෂයේ රු.55,097,500 ක් වූ විශේෂ ත්‍යාග ගෙවීම් වටිනාකම සමාලෝචිත වර්ෂයේදී රු. 596,768,000 ක් දක්වා වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රථවාහන උපදෙස් චක්‍රලේඛ අංක 149/2019 අනුව බීමත්ව රිය ධාවනය නිසා මහජනතාවට සිදුවන හානි දුරු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස හඳුනාගෙන එවැනි වැටලීම් සිදුකරන පොලිස් නිලධාරීන් දිරි ගැන්වීම සඳහා ත්‍යාග මුදල් ගෙවීමට තීරණය කර තිබුණි. එහෙත් බණ්ඩාරවෙල කොට්ඨාශයේ පොලිස් ස්ථාන විසින් බීමත් රියදුරන් 2019 වර්ෂයේදී 391ක් හා 2020 වර්ෂයේදී 800 ක් අත් අඩංගුවට ගෙන තිබූ අතර, කන්තලේ කොට්ඨාශයේ පොලිස් ස්ථාන විසින් බීමත් රියදුරන් 2019 වර්ෂයේදී 113 ක් හා 2020 වර්ෂයේදී 240 ක් ලෙස අත් අඩංගුවට ගෙන තිබූ නමුත් ඊට සහභාගිවූ පොලිස් නිලධාරීන්ට හා | ඉදිරියේදී බීමත් රියදුරන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ත්‍යාග මුදල් ගෙවීම සඳහා පොලිස්පති චක්‍රලේඛයක් මගින් දැනුවත් කිරිමට කටයුතු කරමි. | ත්‍යාග මුදල් හිමි නිලධාරීන්ට ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ස්ථානාධිපතිවරුන්ට කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබිණි. | | |
| (ආ) ඉකුත් වර්ෂයේ දී ජංගම වත්කම් ලෙස දක්වා තිබූ රු.358,794 ක අගරු චෙක්පත් වටිනාකම, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් ශේෂය 2021 වර්ෂයේ දී ගලපා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අගරු චෙක්පත් වටිනාකම නිරවුල් කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව විශේෂ ත්‍යාග ගෙවීම් සඳහා රු. 50,000,000 ක් ඇස්තමේන්තුකර තිබුණු අතර සත්‍ය වියදම රු.596,798,000 ක් වූයෙන් අයවැය ඇස්තමේන්තුව හා සත්‍ය වියදම අතර විචලතාවය සියයට 1094 ක් විය. | විශේෂ ත්‍යාග ගෙවීම සඳහා රු. මිලියන 50 ක්ද සුහසාධන වියදම් සඳහා රු. මි 575 ක් ද වෙන් කරගෙන තිබුණි. කොරෝනා වෛරසය පැතිරීම මැඩ පැවැත්වීම සඳහා පොලිස් නිලධාරීන් දිරි ගැන්වීම සඳහා ලබා දුන් රු. 5,000 හා රු. 3,000 දීමනාව සුහසාධන වියදම් ලෙස ඇතුළත් කර තිබුණි. | අනුමත අයවැය ඇස්තමේන්තුව අනුව වියදම් දැරීම හෝ අයවැය සංශෝධනය සිදුවිය යුතුය. |
| (ආ) සුහසාධන වියදම් ලෙස රු.575,000,000 ක් අයවැය තුල ඇස්තමේන්තුකර තිබුණද වියදම රු.93,277,390 ක් වූයෙන් අයවැය ඇස්තමේන්තුවට වඩා සියයට 84 ක් අඩුවෙන් වැය කර තිබුණි. | රු. මිලියන 573 ක විශේෂ දිරි දීමනාව විශේෂ ත්‍යාග යටතේ ගිණුම්ගත කර ඇති බැවින් සුහසාධන වියදම් අඩු වී ඇත. | -එම- |